## නිර්දේශ:

සෑම මට්ටමකදීම පහත ක්‍රියාකාරකම්වලට උද්‍යෝගයෙන් සහභාගි වීමට රට තුළ සිටින සියලු ක්‍රිස්තියානින්/කතෝලිකයන් දිරිගැන්වීම සහ සංවිධානය කිරීම¨

(1) පවුල් මට්ටමෙන් - රට වෙනුවෙන් අවංක නායකයකු සඳහා නිරන්තරයෙන් යාච්ඤා ඔප්පු කිරීම හා දිනපතා ශුද්ධවූ ජපමාලය කීම¨

(2) ප්‍රජා මට්ටමෙන් - යාච්ඤා සැසි සහ ජාතිය වෙනුවෙන් දිව්‍යමය මැදිහත් වීමක් සඳහා මැදිහත්කරණ යාච්ඤා කණ්ඩායම් ප්‍රවර්ධනය¨

(3) මිසම් මට්ටමෙන් - රට පුරා සිටින සියලුම මිසම් භාර පියතුමන්ලාගේ මඟ පෙන්වීම යටතේ සියලු මිසම්වාසීන් සමඟ මෙම පණිවිඩය බෙදා ගැනීම¨

(4) දිසා මට්ටමෙන් - අපක්ෂපාතී සහ යෝග්‍ය සම්පත් දායකයන්ගේ සහායයෙන් සාකච්ඡාවන් සංවිධානය කිරීම¨

(5) පදවි මට්ටමෙන් - ප්‍රජා මූලිකයන් හා සංවිධානයන් දැනුවත් කිරීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම¨

(6) ඉරිදා දිව්‍ය පූජාවේ දී - ඉරුදින ජනවන්දනාවේදී මෙම අදහස විශ්වාසකයන්ගේ යාච්ඤාවලට ඇතුළත් කිරීම¨


**යුක්තිය, සාමය සහ මානව සංවර්ධනය සඳහා වූ කතෝලික ජාතික කොමිසම**

**කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක්**
**133, කිංසි පාර, කොළඹ 08**
**011 - 2691885**


# කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක්
# සමාජ හා ආර්ථික සංවර්ධන මධ්‍යස්ථානය

**ජනාධිපති ධුරය සඳහා වඩාත් සුදුසුතම අපේක්ෂකයා තෝරා ගැනීමට මඟ පෙන්වන ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ යුක්තිය, සාමය හා මානව සංවර්ධනය සඳහා වූ කොමිසමේ ස්ථාවරය දැක්වෙන ලේඛනය**

## හැඳින්වීම

වර්ෂ 2019 නොවැම්බර් 16 වැනි දින ජනාධිපතිවරණය පැවැත්වෙන බව ශ්‍රී ලංකාවේ ජාතික මැතිවරණ කොමිසමේ සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත් කර ඇත. දස ලක්ෂ 22ක් වූ මුළු ජනගහණයෙන් දස ලක්ෂ 16ක් ශ්‍රී ලංකාවේ 8 වැනි නව ජනාධිපතිවරයා තෝරා ගැනීමට ඡන්දය දීමට සුදුසුකම් ලබා තිබේ¨

රාජ්‍ය පරිපාලනයේ පවත්නා වත්මන් දේශපාලනික අවුල් සහගත තත්ත්වය හා ව්‍යාකූලත්වය හඳුනාගනිමින් ක්‍රිස්තියානි සාමාජීය ඉගැන්වීම්වලට අනුව කාලයේ සලකුණු කියවමින්, විශේෂිතවම, එළැඹෙන ජනාධිපතිවරණය හේතුවෙන්, යුක්තිය, සාමය හා මානව සංවර්ධනය පිළිබඳ කතෝලික ජාතික කොමිසම මෙම තීරණාත්මක කාලයේ පවතින වාතාවරණය සැලකීමට ගෙන ඇත. මෙරට වැසියන් මුහුණදෙන සමාජ හා ආර්ථික ප්‍රශ්න ගණනාවක් මෙන්ම පවත්නා දේශපාලනික සංස්කෘතියේ විවිධ පැතිකඩ කේන්ද්‍ර කර ගනිමින් ඒ ගැන ආවර්ජනය කළෙමු¨

**පහත දැක්වෙන ප්‍රශ්නයන් සම්බන්ධයෙන් වහාම අවධානය යොමු කළ යුතු බව අපගේ විශ්වාසයයි:**

(1) වාර්ගික හා ආගමික ගැටුම්වලට සම්බන්ධ ප්‍රශ්නවලට මෙන්ම අතුරුදහන් වූ පුද්ගලයන්, පෞද්ගලික ඉඩම් නීතිවිරෝධී ලෙස භුක්තියේ තබා ගැනීම සහ බලහත්කාරී අතුරුදහන් කිරීම් සම්බන්ධ ප්‍රශ්නයන්ට විසඳුම් සෙවීමට ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වාදීම.

(2) සියලු ජන සමූහයන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීමටත් බලය බෙදා හැරීම සහතික කිරීමටත් අදාළ සියලු පාර්ශ්වයන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම.

(3) අල්ලසට හා දූෂණයට සම්බන්ධ සියලු දේශපාලනඥයන්, රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් හට එරෙහිව ක්ෂණික නෛතික ක්‍රියාමාර්ගයන් තුළින් අපක්ෂපාතීව නීතිය ක්‍රියාත්මක කිරීමට කැපවීම.

(4) විෂ මත්ද්‍රව්‍ය/අන්තරායකර ඖෂධ මුලිනුපුටා දැමීමට මෙන්ම පාතාලයේ සන්නද්ධ ප්‍රචණ්ඩත්වය හා අහිතකර මාධ්‍ය සංස්කෘතිය සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය බලතල සහිත විශේෂ කාර්ය සාධක බලකායන් ස්ථාපිත කිරීම.

(5) අධිකතර ණය ලබා ගැනීමෙන් තොරව සාධාරණ ලෙස බෙදියාම සමඟ වර්ධනය සහතික කරනු සඳහා ස්වාධීන වෘත්තිකයන්ගේ උපදෙස් ලබා ගනිමින් සාධ්‍ය ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් සකස්කර ක්‍රියාවට නැංවීම.

(6) සියලු රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා යෝග්‍ය අධීක්ෂණ යාන්ත්‍රණයන් සමඟින් යහ පාලනය හඳුන්වා දීම සහ රට තුළ නීතිය හා විනය ස්ථාපිත කිරීම.

(7) යුක්තියේ හා විනිවිදභාවයේ සංස්කෘතියකින් පෝෂිත ස්වාධීන අධිකරණයක් ස්ථාපනය කිරීම.

(8) ගොවි සහ ධීවර ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සහ අභිලාශයන් සහතික කිරීම පිණිස සහ වෙළෙඳපොළ පහසුකම් නොමැති වීම, නිෂ්පාදනයන්ට නිසි මිල ලබා ගැනීම, ස්වාභාවික විපත්වලින් ආරක්ෂාව, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නිසා ඇති වූ අධිකතර ණය, දුප්පත්කම, දේශගුණික වෙනස්වීම් හා පාරිසරික ප්‍රශ්න සහ විරැකියාව වැනි ඔවුන්ගේ දැවෙන ප්‍රශ්නයන්ට විසඳුම් ලබා දෙනු වස් ජාතික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.

(9) වතුකරයේ ජීවත්වන ප්‍රජාවන්ගේ මූලික පහසුකම්වලට ප්‍රවේශය, ප්‍රමාණවත් වැටුප් හා සේවා නියුක්තිය සඳහා ඇති අයිතිය ඇතුළුව ඔවුන්ගේ පහත් ජීවන මට්ටම, ආදී ප්‍රශ්නයන්ට විසඳුම් ලබා දීම සහ ඔවුන්ගේ ගරුත්වය රැක දීම.

(10) මිනිස් ජාවාරම සහ ළමුන් සේවයේ යෙදවීම වැනි සංක්‍රමණික ක්ෂේත්‍රයේ පවත්නා වංචාකාරී පරිචයන් දුරු කිරීමට එවැනි පරිචයන්හි යෙදෙන නියෝජ්‍යායතනවල ක්‍රියාකාරකම් සමීප අධීක්ෂණය තුළින් යාන්ත්‍රණයක්.

# ක්‍රිස්තියානි දැක්ම - මෙනෙහි කිරීම පිණිස - (කතෝලික සභා ධර්මෝපදේශය / ලොව තුළ යුක්තිය)

1. මිනිස් ජීවිතය පාරිශුද්ධය, මන්ද, එහි ආරම්භයේ පටන්ම දෙවියන්වහන්සේගේ නිර්මාණශීලී ක්‍රියාකාරිත්වය හා බැඳී එහි එකම අවසානය වූ නිර්මාතෘ සමඟ සදාකාලිකව විශේෂ සබඳතාවක් ඇතිව සිටී. ජීවිතයේ ආරම්භයේ සිට එහි අවසානය දක්වා එහි ස්වාමියා වන්නේ දෙවියන්වහන්සේ පමණක්ම වන අතර, කිනම් තත්ත්වයක් යටතේ හෝ කිසිවකුට අහිංසක මිනිස් ජීවිතයක් විනාශ කිරීමට සෘජු අයිතියක් ඔහුට ඇතැයි හිමිකම් පෑම කළ නොහැකි ය.¨ (ක. ස. ධ 2258)
සමාජය පුද්ගලයන්ට හෝ සංගමයකට ඔවුන්ගේ ස්වභාවයට හා වෘත්තියට අනුව තමනට හිමි දේ ලබා ගැනීම සඳහා ඉඩ ලබා දෙන තත්ත්වයන් සපයන කල්හි එය සමාජ සාධාරණත්වය සහතික කරයි. සමාජ සාධාරණත්වය, පොදු යහපත හා අධිකාරී බලය භාවිත කිරීම සමඟ බැඳී පවතී. (ක. ස. ධ 1928)

2. අධිකාරී බලය නීත්‍යනුකූලව භාවිත කෙරෙනුයේ එය අදාළ සමූහයේ පොදු යහපත අපේක්ෂා කරන කල්හි සහ එය සාක්ෂාත් කර ගැනීම පිණිස සදාචාරාත්මක නීත්‍යනුකූල මාර්ගයන් අනුගමනය කරන තාක් පමණි. පාලකයන් අසාධාරණ නීති පනවන්නේ නම් හෝ සදාචාරාත්මක විනයට පටහැනි ක්‍රියාමාර්ගයන්හි නියැලේ නම්, එවැනි වැඩපිළිවෙලවල් හෘදය සාක්ෂියට අනුකූල නොවේ. එවන් අවස්ථාවක දී .අධිකාරී බලය සහමුලින්ම බිඳ වැටෙන අතර, නින්දිත අවභාවිතය එහි ප්‍රතිඵලය වන්නේ ය.¨ (ක. ස. ධ 1903)

3. විෂ මත්ද්‍රව්‍ය භාවිතය පාපයක් වන්නේ එය ස්වයං-නාශක ක්‍රියාවක් වීම නිසා සහ එනයින් එය දෙවියන්වහන්සේ විසින් ආදරයෙන් අපට දී ඇති ජීවිතයට එරෙහි වරදක් වන නිසා ය. නීත්‍යනුකූල ද්‍රව්‍යයන් (මද්‍යසාර, බෙහෙත්, දුම්කොළ) මත පුද්ගලයකුගේ සෑම ආකාරයකම යැපීමක් නිදහස වෙනුවට වහල්භාවය හුවමාරු කර ගැනීමකි. ඔහු සිය මානව ගරුත්වයෙන් හා නිදහසෙන් යම් ප්‍රමාණයක් අහිමි කරගන්නා අතර, එනයින් දෙවියන්වහන්සේට එරෙහිව පව් කරයි.¨ (ක. ස. ධ 389)

4. මානව පුද්ගලයා සතු මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීමට දේශපාලන අධිකාරීන් බැඳී සිටී. සෑම කෙනෙකුගේම අයිතිවාසිකම්වලට, විශේෂයෙන්ම පවුල්වල සහ වරප්‍රසාද නොලද්දවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරමින් ඔවුන් මානව හිතවාදී ලෙස යුක්තිය ඉටු කරනු ඇත්තේ ය. (ක. ස. ධ 2237)

5.සාන්ත ජෝන් ක්‍රිසොස්තම් දැඩි ලෙස මෙලෙස සිහිපත් කරයිඃ .අපගේ දේ බෙදා ගැනීමට දුප්පතුන් හට ඉඩ නොදීම යනු ඔවුන්ගෙන් සොරකම් කිරීම සහ ඔවුන්ගේ ජීවිතය අහිමි කිරීම යි. අප සන්තක දේ අපගේ නොවේ, ඔවුන්ගේ ය.¨

6. වෂී 2002ක් වූ මැයි මස 15 දිනැති .විසිඑක් වැනි සියවසේ වහල් වෙළෙඳාම - මිනිස් ජාවාරමෙහි මානව අයිතිවාසිකම් පැතිකඩ¨ යන දෙවැනි ජුවාම් පාවුළු පාප්වහන්සේගේ ලිපියේ සඳහන් පරිදි .මානව පුද්ගලයන් වෙළෙඳාම් කිරීම, මානව ගරුත්වයට එරෙහි පිළිකුල් සහගත වරදක් සේම මූලික මිනිස් අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි. ... එවන් අවස්ථාවන් සියලු ජනතාවන් හා සංස්කෘතීන් කොටස්කරුවන් වන්නා වූ මූලික වටිනාකම්වලට, මානව පුද්ගලයාගේ ස්වභාව තුළම මුල් බැසගත් වටිනාකම්වලට අවමානයකි. මිනිස් වෙළෙඳාමේ බියජනක වර්ධනය, ගෝලීයකරණ ක්‍රියාවලිය හා සබැඳි දේශපාලනික, සාමාජීය හා ආර්ථික ගැටළු අතරින් තදබල එකකි. එය එක් එක් ජාතීන්ගේ ආරක්ෂාවට බලවත් තර්ජනයක් වන්නා සේම ජාත්‍යන්තර යුක්තියේ අතපසු කළ නොහැකි ප්‍රශ්නයක් ද වන්නේ ය.¨

7.නිදහස භුක්ති විඳීමට ඇති අයිතිය, විශේෂයෙන්ම ආගමික හා සදාචාරාත්මක කරුණු සම්බන්ධයෙන් වන විට, මානව පුද්ගලයාගේ ගරුත්වයේ අන්සතු කළ නොහැකි අවශ්‍යතාවකි.¨ (ක. ස. ධ 1738, 332 පිටු)

8. යුක්තිය ස්ථාපනය කිරීම, වඩාත් දුප්පත් ජාතීන් දියුණුවීමට දක්වන අධිෂ්ඨානය මත රඳා පවතී. මෙම අධිෂ්ඨානය නොමැති කල ඔවුන් ජාත්‍යන්තර ආර්ථික බලවේගයන්ගේ ගොදුරු බවට පත් වේ. එම නිසා ඔවුන් ඔවුන්ගේ අනාගතය ඔවුන්ගේම පාලනයටම නතු කර ගත යුතු අතර, ඔවුන්ගේම ආර්ථිකමය, දේශපාලනික හා සාමාජීය ප්‍රගතියට සහභාගීවීමට ඔවුනට අයිතියක් ඇත. ඇතැමුන් කෙරෙහි යුක්තිය ඉටු කිරීමට විශේෂයෙන්ම ක්‍රියාකාරී විය යුතු ය, උදාහරණයක් වශයෙන් සංක්‍රමණිකයන්, ගොවිපොළ සේවකයන්, අනාථයන්, ආගමික නිදහස සහ අනෙකුත් සිවිල් අයිතීන් අහිමි කරනු ලැබූවන් දැක්විය හැකි ය. (ලොව තුළ යුක්තිය - 13-28 ඡෙද)

9. ආර්ථික වර්ධනයත් සහභාගිත්වයත් යන දෙකම අන්තර්ගත සංවර්ධනයක අවශ්‍යතාව හඳුනා නොගෙන සත්‍ය ප්‍රගතිය යන්න - තෝරාගත් දේශපාලනික ක්‍රමය තුළ - සිතා ගත නොහැකි ය. සහභාගිත්වය, ආර්ථික සහ සාමාජීය හා දේශපාලනික යන ක්ෂේත්‍රයන් දෙක තුළම යෙදෙන අයිතිවාසිකමක් සංස්ථාපනය කරයි. (ලොව තුළ යුක්තිය - 18 ඡෙදය)

10. සියල්ලට ඉහළින්, නොයෙක් ආකාරයේ පීඩාවන් නිසා සහ අපගේ සමාජයේ අපගේ වත්මන් චර්යාව නිසා නිහඬ, සැබවින්ම හඬක් නොමැති, අයුක්තියේ වින්දිතයන් වූ මෙම මිනිසුන් හා ජාතීන් කෙරෙහි අපගේ ක්‍රියාකාරිත්වය යොමු කළ යුතු වේ. (ලොව තුළ යුක්තිය - 20 ඡෙදය)

## නිගමනය:

ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ සමාජ හස්තය වන කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක් විසින් මෙම ස්ථාවරය දක්වන ලේඛනය සකස් කරන ලද්දේ, සභාවේ ඉගැන්වීම් මත පදනම්ව රටක රටවැසියන් වශයෙන් සර්වජන ඡන්ද බලය භාවිත කිරීමේ වගකීමෙහි ඇති අත්‍යවශ්‍ය වැදගත්කම පිළිබඳව ප්‍රධාන වශයෙන් පොදු මහජනතාව දැනුවත් කරනු සඳහාත්, විශේෂයෙන්ම ක්‍රිස්තියානි/කතෝලික බැතිමතුන් දැනුවත් කරනු සඳහාත්, ඡන්දය ලබා දීමට සුදුසු අපේක්ෂකයා තෝරා ගැනීමේදී ඔවුනට මග පෙන්වීම සඳහාත් ය.
වත්මන් දේශපාලන ආරාවුල විසින් ඉතා අනතුරුදායක තත්ත්වයකට ඇද දමා ඇති අප මව්බිම ඉක්මණින්ම ඉන් මුදවාලිය යුතු යයි අපි විශ්වාස කරමු.

1. අර්බුදයෙන් අර්බුදයට යන මෙම නිමක් නොපෙනෙන සිද්ධීන් දාමයෙන් වහාම ඉවත්වීමට බල කරනු සඳහා මෙරට ජනතාව බලගැන්විය යුතු ය¨

2. වාර්ගික හා ආගමික අනන්‍යතාව හෝ දේශපාලනික නැඹුරුව නොතකා ඕනෑම ජීවන මට්ටමක රටවැසියන් එකට එක් කරන්නාවූ ශක්තිමත් තිරසර ජනතා ව්‍යාපාරයක අවශ්‍යතාවක් ඇත.

3. එවන් ව්‍යවසායක් තුළ ආගමික විශ්වාසය මත පදනම් වූ ප්‍රජාවන්ට කළ හැකි විශේෂ කාර්යභාරයක් තිබේ.

4. පහත දෑ තුළින් එවන් ව්‍යායාමයකට අගනා හා නිර්භීත නායකත්වයක් සැපයීමට සභාවට හැකියාව ඇත¨

අ) සාමකාමී, ප්‍රජාතාන්ත්‍රික හා අර්ථවත් වෙනසක් ඇති කිරීමේ මගක් ලෙස ඡන්දයේ ඇති බලය පිළිබඳව ජනතාව, විශේෂයෙන්ම යෞවනයන්, අතර, ප්‍රකෘතිමත් වූ දැනුවත් භාවයක් ඇති කිරීම.
ආ) වත්මන් මැතිවරණ නීති හා ඡන්ද ක්‍රම පිළිබඳව ඡන්දදායකයන් දැනුවත් කිරීම.
ඇ) නිකැලැල් චරිතයක් ඇති ආදර්ශවත් පුරුෂයන් සහ කාන්තාවන් තම නායකයන් ලෙස තෝරා පත් කර ගැනීම සහතික කරනු සඳහා, සහ විශේෂයෙන්ම ජනාධිපති අපේක්ෂකයකු සතුව තිබිය යුතු යයි අපේක්ෂා කරන ගුණාංග - එනම්, දේශපාලන පරිණත බව, යුක්තිය හා සාමය කෙරෙහි ඇති පවස, යහපාලනයට ඇති කැපවීම, සමානාත්මතාව හා මිනිස් අයිතිවාසිකම් කෙරෙහි ගරුත්වය, දුප්පතුන් හා පීඩිතයන් කෙරෙහි දක්වන සැලකිල්ල, පක්ෂයේ යහපත ආරක්ෂා කරනවාට වඩා ජනතාවගේ යහපත පෝෂ්‍ය කරනට ඇති අදිටන, ඉස්මතු කරමින් ඡන්දදායකයන් දැනුවත් කිරීම.
ඇ) තම මැතිවරණ පොරොන්දුවල ප්‍රකාශ කර ඇති දේ ක්‍රියාවට නැංවීම සඳහා තෝරා පත්කර ගත් නායකයන් කැමති කරවා ගැනීමට සහ ඒ සඳහා නිරන්තර අවධානයක් පවත්වාගෙන යාමට ඡන්දදායකයන්ට හැකියාව ලබා දීම.
ඉ) බලයේ සිටින්නන් සම්බන්ධයෙන් අනුකූලවීම, වගකීම හා පාරදෘශ්‍යභාවය අධීක්ෂණය කිරීමට සුදුසු යාන්ත්‍රණයන් පිහිටුවීමට උත්සාහ කිරීම¨

ලෝකයේ පවත්නා ප්‍රධාන ආගම් හතරෙහි අනුගාමියන් වන ශ්‍රී ලංකාවේ සමස්ත රටවැසියන් අතර සාමය හා එකමුතුකම සහිත සමයක් උදා කිරීමට යෝග්‍යතම අපේක්ෂකයා හට ඡන්දය දීම සඳහා මෙම මාර්ගෝපදේශයන්ගෙන් බැඳී සිටීමට හා මෙම පණිවිඩය සියලු බැතිමතුන් අතර පැතිරවීමට ක්‍රිස්තියානි/කතෝලික නායකත්වය රට පුරා සිටින ක්‍රිස්තියානින්/කතෝලිකයන් හට මඟපෙන්වීම හා නායකත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනය විසින් අනුමත කර ඇති ක්‍රිස්තියානි/කතෝලික සහෝදරයන්ගේ මෙම කැඳවීමට ප්‍රතිචාර දැක්වීමට සියලු ජනාධිපති අපේක්ෂකයන් උනන්දු කෙරේ. මෙම මාර්ගෝපදේශය පිළියෙළ කිරීමේදී කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක් විසින් .කරිටාස් යනු සභාව විසින් එහි ජනතාව වැළඳගැනීමයි, සහ මෑණියන් විසින් එහි දරුවන් වැළඳගැනීමයි, සමීපවීම හා කරුණාවන්තකම පෑමයි¨ යන ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප්වහන්සේගේ වදන් උපයෝගී කරගනු ලැබීය.

දැවෙන ජාතික ප්‍රශ්න, ඒවා විසඳීමට අදහස් කරන ආකාරය, එක් එක් ප්‍රශ්නය විසඳීම සඳහා අවශ්‍ය කෙරෙන කාලය හා යෝජිත මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධයෙන් සියලු ජනාධිපති අපේක්ෂකයන්ගේ ස්ථාවරය පැහැදිලිව දැන ගැනීමට සභාව අපේක්ෂා කරයි. අපේක්ෂකයන්ගේ නිශ්චිත කැපවීම මත පදනම්ව, යෝග්‍යතම ජනාධිපති අපේක්ෂකයා තෝරා ගැනීම හා ඡන්දය දීම පිළිබඳව සභාව සියලු ක්‍රිස්තියානින්/කතෝලිකයන් හට ඇරයුම් කර මග පෙන්වනු ඇත.